ජනාධිපතිවරණයේ දී තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා වෙන්කළ ස්ථාන මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කර තිබේ.

සැප්තැම්බර් 04 - දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාලවලදී තැපැල් ඡන්ද සලකුණු කළ හැක. සැප්තැම්බර් 04 සහ 06 (දෙදින) - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සහ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල, පොලිස් අධිකාරී සහ සහකාර පොලිස් අධිකාරී කාර්යාල, පොලිස් ස්ථාන, විශේෂ කාර්ය බළකා කඳවුරු, විශේෂ පොලිස් ඒකක සහ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාසවල දී නිල ඇඳුම් කාර්යය මණ්ඩල සහ එම කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සිවිල් කාර්යය මණ්ඩලයට තැපැල් ඡන්ද සලකුණු කිරීමේ හැකියාව පවතී.සැප්තැම්බර් මස 05 සහ 06 (දෙදින) - ත්‍රිවිධ හමුදා කඳවුරු සහ අනෙකුත් සියලු රාජ්‍ය ආයතනවලද තැපැල් ඡන්ද සලකුණු කිරීමේ හැකියාව ඇත. සැප්තැම්බර් 11 සහ 12 (දෙදින) - අදාළ දිනවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ තැපැල් ඡන්ද හිමියන්ට තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී යන දෙදින ඡන්දය සලකුණු කිතරීමේ හැකියාව පවතී.

එම නිවේදනය පහත දැක් වේ

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/55** **2024.08.29**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21
## තැපැල් ඡන්ද සලකුණු කිරීම හා ඒ සඳහා වලංගු හැඳුනුම්පත්

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීම මතු දැක්වෙන පරිදි ඒ ඒ කාර්යාල හා දිනවල දී සිදු කරනු ලැබේ.

| අනු අංකය | කාර්යාලය | | තැපැල් ඡන්ද සලකුණු කරන දිනය |
|---|---|---|---|
| I | • දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>• මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාල | | **2024.09.04** |
| II | • ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල<br>• පොලිස් අධිකාරී/ සහකාර පොලිස් අධිකාරී කාර්යාල<br>• පොලිස් ස්ථාන<br>• විශේෂ කාර්ය බලකාය , විශේෂ පොලිස් ඒකක සහ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශ | නිල ඇඳුම් කාර්යමණ්ඩල හා එම කාර්යාලවලට අනුයුක්ත සිවිල් කාර්යමණ්ඩල | **2024.09.04** හා **2024.09.06** |
| III | • ත්‍රිවිධ හමුදා කඳවුරු | එම | **2024.09.05** හා **2024.09.06** |
| | • සෙසු සියලුම රාජ්‍ය ආයතන | | |
| IV | ඉහත I, II, හා III හි සඳහන් දිනවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකිවන තැපැල් ඡන්ද හිමියන්ට තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී | | **2024.09.11** හා **2024.09.12** |

02. තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පහත දැක්වෙන හැඳුනුම්පතක් ඉදිරිපත් කර අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

**I.** ජාතික හැඳුනුම්පත;
**II.** වලංගු රියදුරු බලපත්‍රය;
**III.** වලංගු විදේශ ගමන් බලපත්‍රය;
**IV.** මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත

03. රාජකාරි හැඳුනුම්පත තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පිළිගනු ලැබූව ද පසුගිය ඡන්ද විමසීම්වලින් පසුව ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගෙන, මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දහිමියන් ස්වකීය රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම් එම තැපැල් ඡන්දහිමියා හඳුනාගැනීම හෙවත් අනන්‍යතාව පරීක්ෂා කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කාර්යය අධීක්ෂණයට පේරිම්භාර නිලධාරීන් විසින් පත්කොට ඇති නිලධරයා විසින් කරනු ඇත. එසේ නොවන අවස්ථාවල දී රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන තැපැල් ඡන්ද හිමියන්ට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවස්ථාව ලබා නොදිය යුතු බවට සහතික කිරීමේ නිලධාරීන් වෙත දන්වා සිටිනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්